ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2008

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය - BUCU- E1015

භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි    කාලය : පැය 03 යි

---

01. පුරාවිද්‍යාත්මක ගවේෂණ තුළින් හෙළිකරගෙන ඇති ප්‍රාග් වෛදික යුගයෙහි පැවති මූලික ආගමික විශ්වාස කවරේදැයි විමර්ශනය කරන්න.

02. සිය කෘෂි ජීවිතය හා බැඳුණු භෞතික පරිසරය පිළිබඳව වෛදික ජනයා තුළ පැවති අවධානය ඔවුන්ගේ දේව විශ්වාස ඇසුරෙන් සනිදර්ශනව පෙන්වා දෙන්න.

03. බමුණු නායකත්වය තුළ ප්‍රචලිත වූ වෛදික යාග විධි, ඒවායේ අරමුණු, ස්වභාවය හා කාර්ය සංසිද්ධිය පිළිබඳ විචාර පූර්වක විවරණයක් කරන්න.

04. අකිරියවාදී ශ්‍රාමණික ඉගැන්වීම් පිළිබඳ මූලික හැඳින්වීමක් කරමින් එමගින් සමාජයට සිදුවන අහිතකර බලපෑම විමසුමට ලක්කරන්න.

05. ශ්‍රමණ සම්ප්‍රදායයේ ප්‍රභවය පිළිබඳව පළකොට ඇති විවිධ විද්වත් මත සමාලෝචනය කරන්න.

06. භාරතීය ඊශ්වර නිර්මාණවාදී චින්තාවන් ද සැලකිල්ලට ගනිමින් බෞද්ධ සංස්කෘතියෙහි අනීශ්වරවාදී පදනම පිළිබඳ ප්‍රමාණවත් ඇගයුමක් කරන්න.

07. සමාජ වර්ගීකරණය විචාරයට ලක්කරමින් බුදුරදුන් විසින් ඒ පිළිබඳව ඉදිරිපත් කරන ලද ජීව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක කරුණු අදාළ මූලාශ්‍රය අනුසාරයෙන් ගෙනහැර දක්වන්න.

08. අත්තකිලමථානුයෝගී දුෂ්කර ව්‍රත බුදුසමය විසින් බැහැරකරන ලද්දේ කවර කරුණු අනුවදැයි සනිදර්ශනව පෙන්වා දෙන්න.

09. ස්ත්‍රීත්වය පිළිබඳ බෞද්ධ විග්‍රහය දේශනානුසාරයෙන් පැහැදිලි කරමින් බෞද්ධ සංස්කෘතිය අනුව විවිධ සමාජ භූමිකාවන් තුළ ඇයට හිමිවූ තැන විමසුමට ලක් කරන්න.

10. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකකට (02)</u> ප්‍රමාණවත් විවරණ සපයන්න.

1. වෛදික ආශ්‍රම ධර්ම
2. අමරා වික්ඛෙප වාදය
3. කාලාම සූත්‍රය
4 ප්‍රඥා ශික්ෂාව

**************************